# පාසල් ගුරුවරුන්ගේ වෘත්තීය භූමිකාව සංවර්ධනය සහ සදාචාර මූලධර්ම

**සමරකෝන් බණ්ඩා**

පාසල් ගුරුවරුන්ගේ සදාචාර සංවර්ධනය ඇති කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ දාර්ශනික, සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක මග පෙන්වීම් මොනවා දැයි විමසා බැලීම ලිපියේ පරමාර්ථයයි. ගුරුවරයාගේ වෘත්තීය ජීවිතය (Professional life) සහ පෞද්ගලික ජීවිතය (Personal life) අතර ඇත්තේ ප්‍රබල සම්බන්ධතාවකි (Gandhi, 1966). එම නිසා අනෙක් වෘත්තීන්ට වඩා ගුරුවරයාගේ පෞද්ගලික ජීවිතයේ සදාචාරය හා වෘත්තීය ජීවිතයේ සදාචාරය එකිනෙකට බලපායි. එම නිසා මෙහි දී 'ගුරුවරයා' සහ 'සදාචාරය' යන සංකල්ප පිළිබඳ විමසීමට ලක් කෙරේ. එසේ ම මනෝවිද්‍යාත්මක (Psychological), දාර්ශනික (Philosopical) සහ සමාජවිද්‍යාත්මක පර්යාලෝක ඔස්සේ පෙන්වා දෙන සදාචාර මූලිකාංග උපයෝගි කර ගෙන සදාචාරවත් ගුරු ජීවිතයක් ගොඩ නඟා ගන්නේ කෙසේ ද? යන කරුණු පිළිබඳ ව මෙහි දී අවධාරණය කෙරේ. විශේෂයෙන් ම මෙහි දී කෝල්බර්ග් (Kohlberg, 1958); පියාජේ (Piaget, 1912); බැන්ඩූරා (Bandura, 1976); රොජර්ස් (Rojers, 1966) සහ ප්‍රොයිඩ් (Frued, 1932) යන මනෝවිද්‍යාඥයන් ඉදිරිපත් කරන සදාචාරය පිළිබඳ අදහස් ඔස්සේ, ගුරුවරයෙක් තම වෘත්තීය ජීවිතය සදාචාරාත්මක ලෙස සංවර්ධනය කර ගන්නේ කෙසේ ද? යන කරුණ සාකච්ඡාවට භාජනය කරනු ලැබේ.

## සදාචාර සංකල්පය විග්‍රහ කිරීම

සදාචාර සංකල්පය පිළිබඳ විවිධ අදහස් ඉදිරිපත් වී තිබේ. එම සෑම අදහසකින් ම කියැවෙන්නේ සමාන අර්ථයකි. සාමාන්‍යයෙන් Moral, Morality යන ඉංග්‍රීසි පද Moralis යන ලතින් පදයෙන් බිඳී ආවෙකි. එහි අර්ථය (Oxford Dictionary, 2010: 995) සමාජ චාරිත්‍ර, සමාජ සම්මතයන්ට අනුව හැසිරීම හා ප්‍රතිමාන යනුවෙන් දැක්වේ.

එනම් හොඳ-නරක, හරි-වැරදි චර්යා පිළිබඳ මූලධර්ම (Principles concerning right and wrong or good and bad behaviour) සදාචාරය ලෙස පෙන්වා දී තිබේ. එමෙන් ම මලලසේකර ශබ්දකෝෂය (2015ඃ 1134) පෙන්වා දෙන්නේ සදාචාරය යනු යහපත, සදාචාරවත්, හොඳ-නරක පිළිබඳ ව, යුක්ති සහගත බව, ආචාර, දැනමිති, ආදර්ශය, දැනමුතුකම, සදුපදේශය, සිරිත් විරිත්, සද්චර්යාව, යුක්ති ධර්මය, සුචරිතය, සුසිරිත, ආචාර ධර්ම ආදි විශිෂ්ට වූත්, සමාජ සම්මත වූත් මානව චර්යාව හැඳින්වීමට යොදන පද විශේෂයක් බව ය. එමෙන් ම කොලින්ස් කෝබිලිඩ් ශබ්දකෝෂය (අධ්‍යාපනයේ දාර්ශනික පදනම, 2001) සදාචාරයට අයත් අර්ථ මොනවා දැයි පෙන්වා දෙයි. එනම් ස්වකීය මතය හෝ සමාජ මතය අනුව සමහර චර්යා වැරදි ය. නුසුදුසු ය. පිළිගත නො හැකි ය. යනුවෙන් පිළිගැනීම ය. තව ද යම් අවස්ථාවක් යටතේ යමෙකු විසින් කරන ලද ක්‍රියාවෙහි ගුණය නිරවද්‍යතාව හා යෝග්‍යතාව තීරණය කිරීම, එමෙන් ම සමාජය විසින් හෝ යම් ජන කණ්ඩායමක් විසින් පුද්ගල චර්යාව හා සම්බන්ධ ව පිළිගනු ලබන මූලධර්ම හා සාරධර්ම පද්ධතිය සදාචාරය ලෙස පිළිගත හැකි ය.

සදාචාර සංකල්පය කුමක් ද යන්න පිළිබඳ පුළුල් විග්‍රහයක් ඉදිරිපත් කරන පියාජේ (Piajet, 1964) පෙන්වා දෙන පරිදි කිසියම් පුද්ගලයෙක් සමාජයේ අන් කවර අයෙකුට හෝ කිනම් ආකාරයක හෝ පීඩාවක් නො වන ආකාරයෙන් තම ඇවතුම් පැවතුම් සකස් කර ගැනීම ඉහළ ම තලයේ සදාචාරය ලෙස සැලකිය හැකි ය. පියාජේට අනුව සදාචාරය වනාහි චර්යා රීති පද්ධතියක් ලෙස අවබෝධ කර ගත හැකි ය.

මේ අතර ජෙෆ්රීස් (1962) පෙන්වා දෙන පරිදි සදාචාරය යනු යහපත සාධනයට හා අයහපත දුරලීමට මග පෙන්වන චර්යා ප්‍රමිති මාලාවක් ලෙස සැලකිය හැකි ය. මෙහි දී සදාචාරය ආකාර දෙකකින් විග්‍රහ කළ හැකි ය. එනම් පවත්නා සමාජයෙහි යහපත් යැයි සම්මත ආකාරයෙන් හැසිරීමයි. එමෙන් ම නිවැරදි යැයි තර්කානුකූල ව ඔප්පු කළ හැකි ආකාරයෙන් හැසිරීමයි.

සදාචාරය යන සංකල්පය ගැඹුරින් විග්‍රහ කර බැලීමේ දී සදාචාරය, සාරධර්ම, අගයයන්, විනය, ආකල්ප, ආචාරධර්ම යන මේ

සංකල්ප අතර ප්‍රබල අවියෝජනීය සම්බන්ධතාවක් පවතින බව පෙනී යයි. ඒවා එකිනෙකින් වෙනස් කළ නො හැකි ය. මෙහි දී අගයයක් (Value) යනුවෙන් හඳුන්වන්නේ යම්කිසි දෙයකට හොඳයි, නරකයි, උසස්, පහත්, ලස්සනයි, අවලස්සනයි, සාධාරණයි, අසාධාරණයි, ප්‍රයෝජනවත් ආදි වශයෙන් මිනිසුන් විසින් පිරිනමන ලද ධනාත්මක හෝ ඍණාත්මක ප්‍රතිචාරයයි. එමෙන් ම සාරධර්ම (Ethics) වශයෙන් අදහස් කරන්නේ සදාචාර මූලධර්මවලට පදනම් වන ගුණාංග සමුදායකි. උදාහරණ වශයෙන් සොරකම් නොකිරීම පුරුදු විය යුතු ය. නැතහොත් සොරකම් කිරීම වැරදි වැඩකි යන සදාචාර මූලධර්මය සඳහා අවංක බව, විශ්වසනීයත්වය, නිවැරදි ක්‍රියාව, සාධාරණය, අනුකම්පාව ආදී සාරධර්ම රැසක් පාදක විය යුතු ය. එම නිසා සදාචාර මූලධර්මවල පදනම සාරධර්ම ලෙස පෙන්වා දිය හැකි ය.

තව ද සදාචාරය, ප්‍රජානන (Cognative), ආවේදන (attitude) සහ මනෝචාලක (phycomote) යන අංශ තුනක් ම නියෝජනය කරන බව ද පෙන්වා දිය හැකි ය.




මෙහි දී ප්‍රජානන අංශය යනු සදාචාරය පිළිබඳ ව බුද්ධියෙන් සිතා බලන අංශයයි. උදාහරණ වශයෙන් ගුරුවරයකුට සැලසුමක් නැතිව අපිළිවෙළට පාඩමක් ඉගැන්වීමෙන් ගැටලුවක් නැත යනුවෙන් සිතුණ හොත්, එහි දී මේ පිළිබඳ සදාචාර විනිශ්චයක් කළ යුතු ය. මෙහි හරි වැරදි බව, එසේ කළොත් තමාට ඇති අවාසි හා විවිධ

හානි පිළිබඳ ඔහු කරනු ලබන සදාචාර විනිශ්චය (Moral Judgement) ප්‍රබල සදාචාර ක්‍රියාවක් බවට පත් වනු ඇත. මෙසේ ගුරුවරයා බුද්ධියෙන් සිතා බලා මෙම ක්‍රියාව හරි ද වැරදි ද යන්න තීරණය කිරීමට සදාචාරමය බුද්ධියක් අවශ්‍ය වේ. එය ගුරුවරයාගේ සදාචාර සංවර්ධනයේ වැදගත් අංශයක් බව පෙන්වා දිය හැකි ය.

තව ද ෆ්‍රොයිඩ් (Frued, 1968) සහ එම ගුරුකුලයේ මනෝවිද්‍යාඥයන් වැඩි අවධානයක් යොමු කළ අංශයක් වූයේ ආවේදන (attitude) අංශයයි. පුද්ගලයාගේ චිත්තවේගීය නැඹුරුව ආවේදන අංශය හා බැඳී පවතී. උදාහරණ වශයෙන් ගුරුවරයා පන්තිකාමරයක නියමිත වේලාවට ගොස් හොඳින් ඉගැන්වූ විට ඉන් ඇති වන ආත්ම ගරුත්වය එසේ නො කළ හොත් ඉන් ඇති වන ලැජ්ජාව, දුර්වල ඇගයීම, එය හොඳ වැඩක් නොවේ ය. යන චේතනාව මෙම අංශයට වැටෙයි. මෙහි දී හොඳින් ඉගැන්වූ විට තමන්ට සහ ළමයින්ට ඇති වන සතුට, මානසික සහනය, කැපවීම පිළිබඳ තෘප්තිය, පෙළඹීම ගුරු සිසු අන්තර් සබඳතා සාධාරණයක් ඉටු කළ බවට දැනෙන හැඟීම මෙම ආවේදන අංශයට අයත් වේ. එය සදාචාර හැඟීම සහිත ආවේදනය ගුරුවරයකුට තිබිය යුතු ම ය.

ඉහත කරුණු දෙක ම ඉටු වන විට සදාචාර ක්‍රියාකාරකම් ආරම්භ වේ. එය මනෝචාලක අංශයයි. මෙහි දී ගුරුවරයාගේ පැත්තෙන් උදාහරණ වශයෙන් සලකා බැලුව හොත්,

- වෙලාවට පන්තියට පැමිණීම
- ඉතා හොඳින් ඉගැන්වීම
- සාධාරණ ලෙස සිසුන්ට සැලකීම
- ප්‍රජාතන්ත්‍රවාදී වාතාවරණයක් පන්ති කාමරයේ ගොඩ නැගීම
- හිතකර ගුරු සිසු අන්තර් සබඳතා පවත්වා ගැනීම
- ප්‍රශ්න කිරීමට ළමයින්ට අවස්ථාව ලබා දීම හා ඒවාට නිසි පිළිතුරු ලබා දීම
- අපක්ෂපාතී ව ක්‍රියා කිරීම
- අවංක ව ළමයින් සමග කටයුතු කිරීම

- හානිදායක දඬුවම් නොකිරීම
- හොඳින් ඉගැන්වීම
- ළමයින්ගේ ගැටලු විසඳීමට සහාය වීම
- පන්ති පිරිසිදු ව තබා ගැනීම
- ප්‍රියජනක හැසිරීම
- මිත්‍රශීලි ව කතා කිරීම
- චිත්තවේග ස්ථාවරත්වය
- ගැටුම් අවම කිරීම

ආදී ධනාත්මක චර්යාවල නිරත වීමට ගුරුවරයා පෙළඹෙයි. මේ අනුව එහි ඇත්තේ ප්‍රබල සදාචාරාත්මක චර්යාවකි. මේ අනුව පැහැදිලි වන්නේ සදාචාර සංකල්පය ප්‍රජානන, ආවේදන, මනෝචාලක යන අංශ සංවර්ධනය වීම ඔස්සේ ක්‍රියාවට නැගෙන බවයි. එම නිසා අප අවධාරණය කරන ගුරුවරයාගේ සදාචාර සංවර්ධනය ඇති කර ගත හැක්කේ කෙසේ දැයි විමසා බැලීම වැදගත් ය.

**ගුරුවරයා පිළිබඳ සංකල්පයෙන් ගම්‍ය වන සදාචාරය**

ශාස්ත්‍රීය විග්‍රහයක් ලෙස දාර්ශනික, මනෝවිද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක පර්යාලෝකවලට අනුව 'ගුරුවරයා' යන වචනය ම පූර්ණ සදාචාරාත්මක අර්ථයක් සහිත පදනමක් මත ගොඩ නැගී තිබේ. ගුරු පදවිය සූර්යයා යටතේ ඇති අන් සියල්ලට ම වඩා අති උත්තම බව කොමෙන්ස්කි (1986) පෙන්වා දෙයි. මේ අතර 'ගුරු' යන්නෙන් 'අඳුර පලවා හරින්නා - ආලෝකය ලබා දෙන්නා' යන අර්ථය පිළිබිඹු කරන බව තාගෝර් (Tagore, 1961) පෙන්වා දෙයි. තව ද මහත්මා ගාන්ධි (Gandhi, 1959) පෙන්වා දෙන්නේ ගුරුවරයා දැල්වෙන ප්‍රදීපයක් විය යුතු බවයි. එයින් අදහස් කරන්නේ ගුරුවරයා සදාචාරය පතුරුවන ආදර්ශමත් පුද්ගලයෙක් (Role Model) බව ය. සිංහල විශ්වකෝෂය (1998) අනුව ගුරු යන ශබ්දය විශිෂ්ට වූ සදාචාර පරමාදර්ශ නිරූපනය කරන සංකල්පයකි. එහි දැක්වෙන පරිදි 'ගුරු' යන සංකල්පයේ සදාචාරාත්මක අර්ථ පහත දැක්වේ.

ගුරු ශබ්දය ආචාර්ය අර්ථයෙහි ද වැටේ. තාරා තන්ත්‍රයේ දැක්වෙන හැටියට ගුරු, පරම ගුරු, පරාපර ගුරු, පරමේෂ්ටි ගුරු යයි ප්‍රභේද සතරෙකි. මොවුන් අතුරෙන් මන්ත්‍ර උගන්වන පරම ගුරුවරයා සෑම තැන්හීම ශ්‍රේෂ්ඨ බව දැක්වේ. ගුරු ශබ්දාකාරයෙන් සිද්ධිය දෙයි. 'ර' කාරයෙන් පාපය දවයි. 'උ' කාරයෙන් වාසනාව ළඟා කර දෙයි. එබැවින් 'ගුරු' ශබ්දයෙන් යථෝක්ථ කරුණු ආත්මගත කොට පවතී. නැවත 'ග' කාරයෙන් ඥානය හා සම්පත් ලාභ ද 'ර' කාරයෙන් පාප දහනය ද 'උ' කාරයෙන් ශාන්තිය ද දෙන බැවින් 'ගුරු' යැයි කියන ලදි. 'ගු' ශබ්දය වනාහි අන්ධකාරය යන අර්ථය වන්නේ 'රු' ශබ්දය එය නිරෝධ (නැති කිරීම) නම් වේ. අන්ධකාරය නිරෝධ කරන බැවින් ගුරු නාමය ව්‍යවහාර කරන බව තන්තාර්ණවයෙහි සඳහන් වේ.

මෙම විග්‍රහයෙන් පැහැදිලි වන්නේ ගුරුවරයා යන සංකල්පය සදාචාරත්මක ගුණාංග රාශියක් පදනම් කර ගත් ගෞරවණීය අර්ථයක් පිළිබිඹු කරන බව ය. එනම් දැනුම, කුසලතා සහ ආකල්ප ප්‍රගුණ කරමින් අන්ධකාරයේ සිටින මිනිසුන්ට ආලෝකය ලබා දීමට මග පෙන්වමින් ඔවුන්ගේ ජීවිත අවදි කරන ප්‍රදීපයක් ලෙස ය.

තව ද උපනිශද් ග්‍රන්ථවලට අනුව සෙන්කර් (Cenker, 1995) පෙන්වා දෙන්නේ ගුරුවරයා යනු ඇස්වල ආවරණය ඉවත් කර මග පෙන්වන්නා ලෙස කටයුතු කරන සදාචාර සම්පන්න පුද්ගලයෙක් බව ය. මේ අතර හින්දු ධර්මය අනුව ගුරුවරයා යනු ලෝක නිර්මාපක බ්‍රහ්මයාට සමාන කෙනෙක් බව ය. එනම් තම ශිෂ්‍යයන්ට, ප්‍රජාවට, ලෝකයට පරමාදර්ශි ලෙස ජීවත් වෙමින් ඔවුන් කෙරේ දයානුකම්පාවෙන් නව ලොවක් නිර්මාණය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන තැනැත්තා ගුරුවරයා බව ය. එමෙන් ම ගුරුවරයා යන අරුත් බර හෝ ගැඹුර (පඤ්ඤානන්ද, 1994ඃ 4) ලෙස ද හඳුන්වයි. එයින් අදහස් කරන්නේ ගුරුවරයා සියල්ලට ම යහපත හෙවත් සදාචාරයට බර සදාචාරය පිළිබඳ ගැඹුර දකින කෙනෙක් බව ය. ගුරුවරයා පිළිබඳ අදහස් දක්වන ෆ්‍රොබෙල් (Frobel, 1826) පෙන්වා දෙන්නේ ගුරුවරයා තම ශිෂ්‍යයින්ගේ සදාචාරාත්මක චර්යාව නිරීක්ෂණය කිරීමෙහි දක්ෂයෙක් බව ය. නිතර ම තම ශිෂ්‍යයින්ට හොඳ නරක තෝරා බේරා ගැනීමේ දක්ෂතා සහිත ව ඉගැන්වීමේ යෙදිය යුතු සදාචාරාත්මක විනිශ්චය හැකියාවකින් යුතු වීම ගුරුවරයාගේ

වගකීම බව චන්බි (Chanbe, 1993) අවධාරණයෙන් පෙන්වා දී ඇත. ලොව සිටි පළමුවන සදාචාරාත්මක ගුරුවරයා බුදුන්වහන්සේ ය. එම නිසා තිලෝගුරු යන නම උන්වහන්සේට භාවිත කරන ලදි. ගුරු යන පදය දෙවැනි වන්නේ බුදු යන පදයට පමණි. එයින් පෙනී යන්නේ සදාචාරය සංවර්ධනය කර ගැනීම හා සංවර්ධනය කර ගැනීමට මග පෙන්වීම සම්බන්ධයෙන් ප්‍රබල වටිනාකමක් ඇති බව ය. ගුරුවරයා කවර ස්වභාවයේ කෙනෙක් ද යන්න සදාචාර සම්පන්න ගති ලක්ෂණ ගණනාවකින් සමන්විත පහත සඳහන් අදහස මංගල සූත්‍රයේ දී (සුත්තනිපාත, 1977) මෙසේ පැහැදිලි කරයි.

''බාහු සච්චංච සිප්පංච - විනයෝච සුසික්ඛිතෝ
සුභාසිතාච යාවාචා - එතං මංගල මුත්තමං''

ගුරුවරයා බොහෝ ශිල්ප ශාස්ත්‍ර පිළිබඳ අවබෝධයකින් සිටිය යුතු ය. එමෙන් ම ගුරු විනය උසස් මට්ටමකින් පවත්වා ගැනීමට අවශ්‍ය වේ. තව ද ගුරු කථාව සදාචාර සම්පන්න විශිෂ්ට එකක් බවට පත් කර ගත යුතු ය. එසේ ම ස්වයං ශික්ෂණය, නීතිගරුක බව සංවර්ධනය කර ගැනීම අවශ්‍ය වේ.

මෙම කරුණු සැලකිල්ලට ගත් විට පැහැදිලි වන්නේ ගුරුවරයා යන වචනය නිරුක්ති ශාස්ත්‍රය (Etymology) අනුව ම සදාචාරය පදනම් කර ගෙන නිර්මාණය වී ඇති බව ය.

**බෞද්ධ සදාචාර වර්ධන මූලධර්ම පිළිපැදීම**

ගුරුවරයාගේ වෘත්තීය ජීවිතය සමස්ත වශයෙන් සදාචාරාත්මක පිබිදීමක් ඇති වීම සඳහා බෞද්ධ සදාචාර මූලධර්ම පිළිපැදීම අතිශයින් වැදගත් වේ. මේ පිළිබඳ අදහස් දක්වන නාරද හිමි (1997), වීරසිංහ (2002), ධර්මාලංකාර හිමි (2000), ප්‍රේමසිරි (1992), කරුණාරත්න (1987), බණ්ඩාර (2010) අවධාරණය කර සිටින්නේ, සදාචාරාත්මක ගුරු භූමිකාවක් උදෙසා බෞද්ධ සදාචාර ධර්ම ඉතා පහසුවෙන් අනුගමනය කළ හැකි බව ය. අංග සම්පූර්ණ ගුරු චර්යාවක් ගොඩ නගා ගැනීමට ද පාරමිතා ධර්ම පදනම කර ගත් සදාචාර ධර්ම පිළිපැදීම බෙහෙවින් ම වැදගත් බව පෙන්වා දිය හැකි ය. බෞද්ධ දර්ශනයේ සඳහන් වන දානය, ශීලය, නෙක්කම්ම, ප්‍රඥාව, වීර්යය,

ඛන්ති, සත්‍යය, අධිෂ්ඨාන, මෛත්‍රීය, උපේක්ෂාව අනුව ගුරුවරයා කටයුතු කිරීම සදාචාර සංවර්ධනයට බෙහෙවින් වැදගත් වේ.

පාරමී ධර්ම ගුරු භූමිකාවේ සදාචාර ධර්ම වර්ධනයට සම්බන්ධ කිරීම බෙහෙවින් ම වැදගත් ය. මෙහි දී දානය වශයෙන් හඳුන්වන්නේ ගුරුවරයාගේ කැප වීමේ ගුණයයි. පරිත්‍යාග ශීලිභාවයෙන් ශිෂ්‍ය සංවර්ධනය සඳහා වැඩ කිරීම ගුරුවරයාගේ උසස් සදාචාරාත්මක ගුණයක් බව පෙන්වා දිය හැකි ය. අනෙක් අතට මෙහි දෙවැනි මූලධර්මය ලෙස සීලය හඳුන්වා දිය හැකි ය. ගුරුවරයා සිත, කය, වචන වඩාත් අර්ථවත් පරිදි භාවිත කිරීම උසස් සදාචාර ගුණාංගයකි. එමෙන් ම නෙක්කම්ම මූලධර්මයෙන් ඔහු විග්‍රහ කරන්නේ ගුරුවරයාගේ වැරදි ක්‍රමයෙන් ඉවත් කර ගැනීමට කටයුතු කිරීමයි. ගුරුවරයාගේ වැරදි පිළිබඳ අදහස් දක්වන හාග්‍රිව් (Hargreave, 1966) පැහැදිලි කරන්නේ ලෝකයේ බොහෝ ගුරුවරුන් මෙම සංවරභාවය නැමැති සදාචාර මූලධර්මය කඩවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපචාරී ක්‍රියාවලට වරදකරුවන් වන බවයි. මේ අතර ගුරුවරයා ප්‍රඥාවන්ත ව ක්‍රියා කළ යුතු බව ප්‍රඥා ගුණයෙන් කියැවේ. එමෙන් ම ගුරුවරයාට වීර්යවන්තනට කටයුතු කිරීම සදාචාර ජීවිතයේ උසස් ගුණයකි. එසේ උස්සාහ නො කරන විට ගුරු චර්යාව යාන්ත්‍රික වන අතර (Chaube, 1993) තම පන්තියේ ළමයින් හැඩ ගස්වා ගැනීමට නො හැකි වේ. එමෙන් ම සදාචාරවත් ගුරුවරයා වීර්යයෙන් කටයුතු කරන කෙනෙකු (Montessori, 1948) බව ද පෙන්වා දිය හැකි ය.

තව ද ගුරුවරයාගේ ඉවසීමේ ගුණය මෙන් ම සත්‍යවාදී බව, අධිෂ්ඨානශීලීත්වය මෛත්‍රිය හා උපේක්‍ෂාව සදාචාර ගුරු චර්යාව අර්ථවත් කරයි. ගුරුවරයෙකුට සදාචාරාත්මක වශයෙන් ආකාර දෙකකින් ඉවසීමට සිදු වේ. එනම් තමන්ට ලැබෙන ලාභ කීර්ති ප්‍රශංසාවල දී ඉවසීම ඉන් පළමු වැන්නය. එමෙන් ම කලබල නො වන නො සැලෙන දෝෂාරෝපණ අපකීර්ති ආදිය පිළිබඳ මනා ඉවසීමෙන් යුතු ව ගුරුවරයා ක්‍රියා කළ යුතු බව (මංගල සූත්‍රය; සිගාලෝවාද සූත්‍රය, 1976) පෙන්වා දිය හැකි ය. එමෙන් ම සත්‍ය ගුණයෙන් සත්‍ය ඉගැන්වීම, බොරු නොකිරීම, මුලා නොකිරීම ද, අධිෂ්ඨාන ගුණයෙන් ශිෂ්‍ය සංවර්ධනය උදෙසා සැලසුම් සහගත ව කටයුතු කිරීම ද, මෛත්‍රී ගුණයෙන් ශිෂ්‍යයන් සමඟ මිත්‍රශීලී ව සහානුකම්පිත ව කටයුතු කිරීම ද,

උපේක්ෂා ගුණයෙන් මධ්‍යස්ථ ව සිටීමේ පුරුද්ද ද සංවර්ධනය කර ගැනීම වැදගත් සදාචාර ගුණාංග ලෙස පිළිපැදීම අවශ්‍ය වේ.

**සදාචාර ගුණාංග ප්‍රායෝගික ව වර්ධනය කර ගැනීම**

ගුරුවරුන් ප්‍රායෝගික ව වර්ධනය කර ගත යුතු සදාචාර ගුණාංග (Moral qualities) රාශියක් පවතින අතර මේ පිළිබඳ අවබෝධයක් ලැබීම ගුරුවරයාගේ සදාචාර වර්ධනයට මෙන් ම ශිෂ්‍යයින්ගේ ප්‍රජාවගේ සහ වෘත්තීය සංවර්ධනයට ද බෙහෙවින් ම වැදගත් වේ. එවැනි සදාචාර ගුණාංග මොනවා දැයි දාර්ශනිකයන්, සමාජ විද්‍යාඥයන් හා මනෝ විද්‍යාඥයන් අවධාරණය කර තිබේ. මේ පිළිබඳ ඉදිරිපත් කළ විවිධ අදහස් පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.

ගුරුවරයා තමාගේ වෘත්තියට ආදරය කිරීම (Love of profession) වැදගත් සදාචාර ගුණාංගයකි. එනම් වෘත්තියේ වැදගත්කම පිළිබඳ හැඟීමක් (The teacher should feel the importance of his profession) ගුරුවරයාට ඇති විය යුතු ය. මෙහි දී ඩුවී (Dewey, 1930) පෙන්වා දෙන්නේ සෑම ගුරුවරයකුට ම ස්වකීය ගරුත්වය පිළිබඳ අවබෝධයක් (Every teacher should realise the dignity of his life) තිබිය යුතු බවයි. එමෙන් ම ගුරුවරයා තම වෘත්තීය පිළිබඳ ආඩම්බරයෙන් නැතහොත් ධනාත්මක හැඟීමෙන් යුතු ව ක්‍රියා කළ යුතු බව විලියම් (William) පෙන්වා දෙයි.

ගුරුවරයාගේ සදාචාර ගුණාංග පිළිබඳ අදහස් දක්වන අගාවල් (Aggarwal, 2003) පෙන්වා දෙන්නේ ළමයින්ට ආදරයෙන් සැලකීම (Love of children) ගුරුවරයෙකුට තිබිය යුතු සදාචාර ගුණාංගයක් බව ය. ඔහු දාර්ශනික අදහස් සැලකිල්ලට ගෙන පවසන්නේ කවර හෝ ගුරුවරයෙක් ළමයින්ට කැමති නැත්නම් වෘත්තියේ නොසිටිය යුතු (One who does not like children should not stay in teaching) බව ය. එසේ නම් ළමයින්ට ආදරය කිරීම කොතරම් සදාචාරශීලී චර්යාවක් ද යන්න පැහැදිලි වේ. මෙහි දී තවදුරටත් අදහස් දක්වන අගාවල් පෙන්වා දෙන්නේ ගුරුවරයා ළමයාට ආදරයෙන් කාරුණික ව සැලකීමේ දී ළමයා ද පෙරළා ගුරුවරයාට ආදරය කරන (Love the child and he will love you, hate the child and the child will

hate you) බව ය. මේ අනුව පැහැදිලි වන්නේ ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට ආදරයෙන් කරුණාවෙන් සැලකීම උත්තරීතර සදාචාර ගුණාංගයක් බවයි.

ගුරුවරයාගේ සදාචාර සංවර්ධනය පිළිබඳ අදහස් දක්වන ඉකේදා (2005) පෙන්වා දෙන්නේ ළමයින්ට කාරුණික ව හා මෛත්‍රී සහගත ව ක්‍රියා කිරීම අවශ්‍ය බවයි. තමන් සිටින උස් ආසනවලින් බැස ළමයා ළඟට විත් කටයුතු කිරීමේ සදාචාරාත්මක නැමියාවක් ගුරුවරයා තුළ වගා කර ගත යුතු බව ඉකේදා තවදුරටත් අවධාරණය කරයි. තව ද ඉස්ලාම් දර්ශනය අනුව ගුරුවරයා තුළ තිබිය යුතු යැයි අපේක්ෂා කරන ගති ලක්ෂණ හෙවත් සදාචාර ගුණාංග රාශියක් (ජා.අ.අ. 1989) පවතින බව මෙසේ පෙන්වා දිය හැකි ය.

- අල්ලා දෙවියන් වෙනුවෙන් කියැවෙන ඉගැන්වීම්වලට කැප වීම
- පාරිශුද්ධිය
- අවංකභාවය
- වැඩට ඇති ලැදියාව
- ඉවසීම
- ආභිමානාත්මක ගති ලක්ෂණ
- ගැඹුරු චර්යාව
- ගුරුවරයා පියෙකුට සමාන වීම
- ගුරුවරිය මවකට සමාන වීම
- උපදේශකයකු වීම
- ප්‍රවීණත්වය සඳහා අඛණ්ඩ ඉගෙනුම

ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය සඳහා ගුරුවරයා තම දැනුම හා සේවය සම්පූර්ණයෙන් ම කැප කළ යුතු බව ඉස්ලාම් දහමේ සඳහන් වේ. ඉස්ලාම් සමාජයේ ගුරුවරයාට ලැබුණේ ඉතා වැදගත් ස්ථානයකි. ඔහු ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික පීතෘවරයා වශයෙන් සැලකිණි. ඉගැන්වීම දේව කැමැත්ත උදෙසා යොමු වූ අතර සේවය සඳහා කිසි ම

ආකාරයක ශාස්තෘවක් අය කර නො ගත්තේ ය. මෙය ගුරුවරයාගේ සදාචාරාත්මක චර්යාව මත ක්‍රියාත්මක වන අධ්‍යාපනයක් ලෙස අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි පවතී.

මේ අතර ක්‍රිස්තියානි දර්ශනය අවධාරණය කරන්නේ අධ්‍යාපනය තුළින් ගුරු භූමිකාව ඔස්සේ සුබදායක සදාචාර සම්පන්න ජීවිත රටාවක් ගොඩ ගැනීම අවශ්‍ය බවයි. මෙහි දී අධ්‍යාපනය ඔස්සේ සදාචාරාත්මක ජීව බල වර්ධනයක් අපේක්ෂා කරයි. එනම් ගුරුවරුන් එම ඉලක්කයට ළමයා සංවර්ධනය නොකරන්නේ නම් ගුරුවරුන් ද්‍රෝහීන්ගේ ගණයට වැටෙන බව පවසයි. මෙහි දී සදාචාර සංවර්ධනයක් සහිත ගුරුවරයෙක් යනු ගුණාංග ගණනාවක එකතුවක් ලෙස බව පෙන්වා දිය හැකි ය. එම ගුණාංග කවරේ දැයි ගුරුවරයා යන වචනයේ අකුරුවලින් නිරූපණය වන අර්ථ ඔස්සේ විග්‍රහ කර තිබේ (Aggarwal, 2005), එනම්

| | | |
|---|---|---|
| T→ | Tact → | දක්ෂ බව |
| | Tolerance → | ඉවසීම |
| | Truth → | සත්‍ය |
| E→ | Efficiency → | කාර්යක්ෂම |
| | Enthusiassm → | උනන්දුව |
| | Ethics → | ආචාරධර්ම |
| | Etiquette → | ආචාරශීලී |
| A→ | Adaptability → | සකස් කළ හැකි |
| | Affection → | දයාව |
| | Alertness → | පරීක්ෂාකාරී |
| C→ | Character → | චරිතය |
| | Clarity → | පිරිසිදු බව |
| | Constructiveness → | සකස් කළ හැකි |
| | Creativity → | නිර්මාණශීලී බව |
| H→ | Hard work → | හොඳින් වැඩ කරන |
| | Himmility → | මානුෂික බව |
| | Honesty → | අවංක බව |
| | Human Relation → | මානව සබඳතා |
| E→ | Eagerness → | වුවමනාව |
| | Efficiency → | කාර්යක්ෂමතාව |
| | Emotional stability → | චිත්තවේගීය ස්ථායි බව |
| R→ | Rationality → | තර්කාන්විත |
| | Relationship → | සම්බන්ධතාව |
| | Resource fullness → | සම්පත්දායි බව |

ඉහත රූප සටහනින් පෙන්නුම් කරන්නේ ගුරුවරයා යන වචනයෙන් ම පිළිබිඹු වන්නේ ඔහු සදාචාර ගුණාංග රාශියක් සහිත පුද්ගලයෙක් බව ය.

**ගුරු කථාව හා සදාචාර වර්ධනය**

පුද්ගලයෙකුගේ සදාචාරාත්මක චර්යාව නිරූපණය කරන වැදගත් ම අංශය කථා කරන විලාසයයි. මේ අනුව ගුරුවරයාගේ සදාචාරාත්මක බව, ඔහුගේ චින්තනයේ ස්වභාවය ගුරුවරයා භාවිත කරන වචනවලින්, ප්‍රකාශ කිරීමේ ස්වභාවයෙන් පිළිබිඹු වේ. මේ පිළිබඳ අදහස් දක්වන හෝල්ට් (Holt, 1964) පෙන්වා දෙන්නේ ගුරු කථාව සදාචාරාත්මක විය යුතු බව ය. බුදුන් වහන්සේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ දී සම්මා වාචා යනුවෙන් පෙන්වා දෙන ලද්දේ ද පුද්ගලයෙක් සදාචාරවත් ලෙස වචන භාවිත කළ යුතු බව ය. එම නිසා ගුරුවරයාගේ කථාව හා එහි විවිධ ස්වරූප උසස් ලෙස පවත්වා ගැනීම අවශ්‍ය වේ.

සදාචාර සම්පන්න ගුරු කථාව තුළ දැකිය හැකි ලක්ෂණ රාශියක් මේ පිළිබඳ ව කරන ලද පර්යේෂණවලින් (බණ්ඩාර, 2010; ඉකේදා, 2005; ගමගේ, 2005; මිලර්, 2005; යශෝධා, 2017) අනාවරණය වේ. ඒ අනුව ගුරුවරයෙක් සදාචාරාත්මක ලෙස තම කතාව හසුරුවා ගත යුතු ය. එනම් තමන් උසස් කොට කථා නොකිරීම, අනුන් පහත් කොට කථා නොකිරීම, බොරු කීම, ඕපාදූපා කීම, පරුෂ වචන කීම, බැන වැදීම, ළමයින්ට නංවනම් කීම, අවඥාවට ලක් කිරීම, අවතක්සේරු කිරීම, අපහාස වචන කීම, ආත්ම ගරුත්වයට හානි වන වචන කීම, අපහාස කිරීම, උපහාසයට ලක් කිරීම, සමච්චලයට ලක් කිරීම, කේලාම් කීම, වහසි බස් දෙඩවීම, අධෛර්යයට පත් කිරීම, නින්දා කිරීම, මව්පියන්, ප්‍රදේශය, කුලය, ජාතිය, වර්ණය හා වර්ගය විවේචනය කිරීම නො කළ යුතු ය, මෙවැනි හානිදායක වචන භාවිත කිරීමෙන් ශිෂ්‍යයන්ගේ ආතතිය, කාංසාව සහ මානසික අවපීඩනය වැඩි විය හැකි ය. මේ අතර ආවේගශීලි ව කථා කිරීම, (Emotional talk) වේගයෙන් සැරෙන් කථා කිරීම නො කළ යුතු ය. ගුරු කථාව මෙලෙස කළ හොත් එය සදාචාර විරෝධී භාෂාවක් ලෙස පිළිකුලට භාජනය කෙරේ. එම නිසා උසස් භාෂාවක් ශිෂ්ට භාෂාවක් (Polite

language) භාවිත කිරීම සදාචාරවත් ගුරු කථාවක් ලෙස අගය කළ හැකි ය.

මේ අතර සදාචාරවත් ලෙස කථා කිරීම කෙසේ කළ යුතු ද යන්න බුදුන් වහන්සේ බ්‍රහ්මායු සූත්‍රයේ (ම.නි. 2ඃ 1973) පැහැදිලි කර තිබේ. එනම් ගුරුවරයා කට හඬ හොඳින් පැහැදිලි ව කථා කිරීම, මිහිරි ලෙස කථා කිරීම, නිවැරදි ව කථා කිරීම, සරල ව කථා කිරීම, පිළිවෙළට කතා කිරීම, අවුලකින් තොර ව කථා කිරීම, අවබෝධ වන පරිදි කතා කිරීම, වඩාත් සදාචාරවත් බව පෙන්වා දෙයි. එමෙන් ම ධම්ම කථික සූත්‍රයේ දී (අ.නි., 1962) සදාචාරවත් කථා ප්‍රමාණය පිළිබඳ අදහස් පැහැදිලි කරයි. එනම් ගුරුවරයා අර්ථ රහිත ව ස්වල්පයක් කථා කිරීම නුසුදුසු ය. තව ද අර්ථ සහිත ව ස්වල්පයක් කථා කිරීම වඩාත් සුදුසු ය. අර්ථ රහිත බොහෝ කථා කිරීමත් නුසුදුසු ය. එමෙන් ම අර්ථ සහිත ව බොහෝ කොට කථා කිරීමත් නුසුදුසුයි. මෙහි දී නුසුදුසු ය යනුවෙන් පෙන්වා දෙන්නේ එවැනි කථා ශිෂ්‍යයන්ට බෙහෙවින් අප්‍රියජනක හා හානිකර බැවිනි. එය සදාචාර විරෝධී වේ. තව ද ගුරු කථාව කර ගෙන යාමේ දී සදාචාර විරෝධී වන අවස්ථා කිහිපයක් පඨමබත සූත්‍රයේ දී (අ.නි. 4, 1962) පෙන්වා දී තිබේ. එනම් නුසුදුසු දුර්ගුණ ඇති පුද්ගලයෙකුගේ ගුණ කීම, ගුණ වර්ණනා කළ යුත්තකුගේ අගුණ කීම, අප්‍රසාදය උපදවන කථා ආදි වශයෙන් සදාචාරවත් ලෙස කථාව පවත්වා ගැනීම සදාචාරාත්මක ලෙස කළ හැකි බව පෙන්වා දී තිබේ. මේ අනුව පැහැදිලි වන්නේ ගුරුවරයෙකුට තම ගුරු කථාව සදාචාරවත් ලෙස පවත්වා ගැනීමට මෙම මග පෙන්වීම බෙහෙවින් ම මහෝපකාරි වන බව ය.

**සහානුකම්පාව හා ගුරු සදාචාර වර්ධනය**

ගුරුවරයෙකුට පමණක් නො ව සෑම මිනිසකු තුළ ම සංවර්ධනය කර ගත යුතු සදාචාර ගුණාංගයක් ලෙස සහනුකම්පාව (Empathy) වැදගත් වේ. ගුරුවරයෙක් උපදේශකවරයෙක් ලෙස කටයුතු කිරීමේ දී මෙම සහානුකම්පාව බෙහෙවින් වැදගත් බව රොජර්ස් (Rogess, 1961) පෙන්වා දෙයි. මේ සඳහා ගුරුවරයා සිය භාවමය බුද්ධිය (Emotional inteligence) සංවර්ධනය කර ගත යුතු ය. ඩැනියෙල් ගොල්මන් (Daniel Goleman,1995) පෙන්වා දෙන

පරිදි භාවමය බුද්ධිය යනු තමා සමගත් අන්‍යයන් සමගත් ඇති කර ගනු ලබන විවිධ සබඳතා තුළින් ධනාත්මක ප්‍රතිඵල ඉස්මතු කර ගැනීමේ හැකියාවයි. මේ සමග හොවාඩ් ගාර්ඩ්නර් (Howard Gardner,1983) ඉදිරිපත් කළ බහුවිධ බුද්ධි න්‍යායය ද (multiple intelligence) මෙම සංවේදන හැකියාව සඳහා ප්‍රබල අවශ්‍යතාවකි. විශේෂයෙන් ම ගුරුවරයාට පාසල් සිසුන් කෙරෙහි සංවේදනයකින් යුතු ව ක්‍රියා කිරීමට සිදු වේ. එම සංවේදනය කෙතෙක් සදාචාරාත්මක වටිනාකමකින් යුක්ත ද කිව හොත් මාතෘ හා පීතෘ සෙනෙහසකින් යුතු ව තම ශිෂ්‍යයන් සමග කටයුතු කළ යුතු ය.

**මානව අන්තර් සබඳතා වර්ධනය හා ගුරුවරයාගේ සදාචාරය**

පාසල් සන්දර්භය තුළ ගුරුවරයාට ශිෂ්‍යයාගේ ප්‍රගතිය උදෙසා විවිධ මානව අන්තර් සබඳතා ගොඩ නගා ගැනීමට සිදු වේ. එම සබඳතාවල ස්වභාවය පහත දැක්වේ. එනම් විවිධ පාර්ශ්ව සමග සහයෝගයෙන් කටයුතු කිරීමට සිදු වන බව එහිදී පැහැදිලි වේ.




ගුරුවරයා දක්වන අන්තර් සබඳතාව වඩාත් ශක්තිමත් වන්නේ සදාචාර ගුණාංග මත ය. මෙම සදාචාරාත්මක චේතනාව ශක්තිමත්

වීමට විවිධ සාරධර්ම රාශියක් තිබිය යුතු ය. එනම් දයාව, ධෛර්යය, සත්‍ය වචනය, නිරහංකාරය, සාමය, ප්‍රඥාව, සතුට, මුදිතාව, වික්‍රමය, විචාරය, සිහිය, ස්වයං ශික්ෂණය, අහිංසාව, පිළිවෙළ, සාධාරණය, යුක්ති සහගත බව, සමානාත්මතාව, ප්‍රිය වචනය, මිත්‍රශීලිභාවය, අවංක බව, විශ්වසනීයත්වය, නිවැරදි ක්‍රියාව, වගකීම, සහෝදරත්වය, සංවේදි බව, උපකාරය, සුබවාදී දැක්ම, අන්‍යයන් ඇගයීම, ප්‍රිය වචනය, සහයෝගය වැනි සාරධර්ම පද්ධතියක් තිබිය යුතු ය. විශේෂයෙන් ම මෙම සාරධර්ම බිඳ වැටීමේ වේගය අනුව මානව අන්තර් සබඳතා පද්ධතිය ද බිඳ වැටීමට ලක් වේ. එම නිසා ම සදාචාර මූලධර්ම නිශ්ක්‍රීය තත්වයට පත් වේ. එම නිසා ගුරුවරයා මෙම එකිනෙක සාරධර්ම ආරක්ෂා කර ගනිමින් සදාචාරත්මක සම්බන්ධතාව සංවර්ධනය කර ගැනීම අවශ්‍ය වේ.

**යුතුකම් සහ වගකීම් ඉටු කිරීම හා සදාචාරය**

ගුරුවරයෙක් තම වෘත්තීය භූමිකාව තුළ විවිධ යුතුකම් සහ වගකීම් ඉටු කළ යුතු ය. විශේෂයෙන් ම ශිෂ්‍යයාට, ආයතනයට, රජයට, ප්‍රජාවට පරිසරයට ඉටු කරන මෙම යුතුකම් හා වගකීම් සදාචාර මූලධර්මවලට එකඟ විය යුතු ය. මේ පිළිබඳ අදහස් දක්වන ප්ලේටෝ (Plato, 1952); ඩුවී (Dewey, 1956); රූසෝ (Rosseau, 1911); මහත්මා ගාන්ධි (Gandhi,1959); මොන්ටිසෝරි (Montessori, 1948); රසල් (Russell, 1946) සහ පීටර්ස් (Peters, 1973) වැනි සාම්ප්‍රදායික හා විශ්ලේශීය අධ්‍යාපන දාර්ශනිකයන් පෙන්වා දෙන්නේ සදාචාරත්මක ජීවිතය තම වගකීම් හා යුතුකම් නිසි පරිදි ඉටු කිරීමෙන් මූර්තිමත් වන බවයි.

විශේෂයෙන් ම බුදුන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ දී (දීඝනිකාය 3, 1976: 308) ගුරුවරයා ශිෂ්‍යයාට තම වගකීම් හා යුතුකම් සදාචාරාත්මක ව ඉටු කළ යුතු ආකාරය මෙසේ පෙන්වා දී තිබේ. එනම්

- ශිෂ්‍යයා මනා ලෙස හික්මවීම
- ශිෂ්‍යයාට මනා ලෙස ඉගැන්වීම
- සියලු ශිල්ප ශාස්ත්‍ර හැදෑරවීම

- මිත්‍ර වර්ගයාට හඳුන්වා දීම
- ආරක්ෂාව සැලසීම

මේ අතර මහාවග්ග පාලියේ දී (1957) පෙන්වා දෙන පරිදි ගුරුවරයා ශිෂ්‍යයාට අවවාද කරන්නෙකු වීම, සංග්‍රහ කරන්නෙකු වීම, අනුග්‍රහ කරන්නෙකු වීම, උගන්වන්නෙකු වීම, ගුණ නිතර සොයා බලා නිසි මග පෙන්වන්නෙකු වීම, ශිෂ්‍යයාගෙන් කරුණු සොයා බැලීම හා විමසන්නෙකු වීම ආදී වශයෙන් ශිෂ්‍යයාට මහත් ආදරයෙන් තම දරුවාට මෙන් සැලකීම ගුරුවරයාගේ සදාචාර ජීවිත අර්ථවත් කරන මහා දාර්ශනික මූලධර්ම ලෙස පිළිපැදීම වැදගත් වේ. මෙම සදාචාර මූලධර්ම ගුරු ජීවිතය තුළින් නිසි පරිදි ක්‍රියාවට නැගේ නම් ශිෂ්‍ය අපචාරී ක්‍රියා, ආතතිය, කාංසාව (Anxiety) මානසික අවපීඩනය (Depression) අවම තත්වයකට පත් වන බව පෙන්වා දිය හැකි ය.

මේ අනුව ද පැහැදිලි වන්නේ කවර රටක සංස්කෘතියක සමාජයක වුවත් ගුරුවරයා සදාචාර වර්ධනය ඇති කර ගන්නා සහ එය පතුරුවා හරින පුද්ගලයෙකු ලෙස ක්‍රියා කළ යුතු බවයි. අනෙක ගුරුවරයාගේ සියලු ම යහපත් ක්‍රියා කලාපය සදාචාරයට අයත් වන බව ය.

**ගුරු ආකල්ප සංවර්ධනය හා සදාචාරය**

සදාචාරවත් ගුරු ජීවිතයක් ගොඩ නැගීමේ වැදගත් ම පියවර ගුරුවරයාගේ ආකල්ප සංවර්ධනය කිරීමය. ගුරුවරයා තම පාසල, වෘත්තීය, ළමයින්, දෙමාපියන්, පරිපාලනය, අනෙකුත් ගුරුවරුන්, පරිසරය, ඉගැන්වීම් ක්‍රියාවලිය, ඇගයීම්, දඬුවම ආදී වශයෙන් පාසල හා බැඳුණු විවිධ අංශ පිළිබඳ බලන විදිය, දකින ආකාරය නැතහොත් පර්යාලෝකය යහපත් අතට යොමු කිරීම බෙහෙවින් ම වැදගත් වේ. ගුරුවරයාගේ ඵලදායිතාව පිළිබඳ සිදු කෙරී ඇති අන්තර් ජාතික මට්ටමේ පර්යේෂණවලින් (වොඩ්ලි, 1982; රොසන් ෂයින්, 1986; බර් හා ඩුබාන්, 1983; ට්‍රිකට්, 1973; ඩොයිල්, 1986; ගුඩ්, 1987; ඇන්ඩර්සන්, 1999) පෙන්වා දෙන පොදු නිගමනය වන්නේ දකුණු ආසියාතික පාසල්වල ගුරුවරුන්ගේ ආකල්පවල නිශේධාත්මක ලක්ෂණ වැඩි වෙමින් පවතින අතර ප්‍රතිජනනාත්මක ලක්ෂණ අඩු වෙමින් පවතින බව ය. කෙසේ වෙතත් පාසල් ගුරුවරුන්ගේ ආකල්ප ධනාත්මක

නැඹුරුවක් ඇති වන විට ගුරු සදාචාර සංවර්ධනය වැඩි වන බවත්, ගුරු ආකල්ප ප්‍රතිශේධාත්මක වන විට සදාචාර සංවර්ධනය අඩු වන බවත් පෙන්වා දිය හැකි ය.

ඉහත දැක්වූ පර්යේෂණවලින් අනාවරණය වූ ගුරු ආකල්ප හා බැඳුණු සදාචාර විරෝධී ගැටලු කිහිපයක් පහත දැක්වේ.

- ගුරුවරු ධනාත්මක ලෙස වෙනස් වීමට දක්වන අකැමැත්ත
- වෙනසක් අවශ්‍ය බව ද දැන නොසිටීම
- වෙනස් වීමෙන් ද කිසිදු වෙනසක් සිදු නො වන බවට ඇති විශ්වාසය
- ශිෂ්‍යයන්ගේ අදහස් නොපිළිගැනීම හා පිළිගැනීමට මැළි වීම
- ශිෂ්‍යයන් සාර්ථක වීම පිළිබඳ සම්මුති ගුරුවරුන් විසින් නියම නොකිරීම
- ක්‍රියාශීලි ගුරු භූමිකා පිළිබඳ ගැටලු පැවතීම
- ශිෂ්‍යයින්ගේ පිළිතුරු අනුව දක්වන ගුරු ප්‍රතික්‍රියා දුබල වීම
- ශිෂ්‍යයින්ගේ ඉගෙනීමේ ඵලදායි වෙනස්කම් පිළිබඳ සාක්ෂිවලින් තොර ව ගුරුවරුන්ගේ විශ්වාස හා ආකල්පවල සැලකිය යුතු වෙනස්කම් ඇති කිරීම ඉතා අසීරු තරම් ය (1986: 9).
- ගුරුවරු නොපෙළඹීම
- ළමයින් පෙළඹවීමට උත්සාහ නොගැනීම
- ගුරුවරයාගේ පෙළඹවීම පිළිබඳ ගැටලු පැවතීම
- ශිෂ්‍ය පෙළඹවීම සඳහා ගුරුවරුන් විසින් ගනු ලබන උපාය මාර්ගවල දුර්වලකම් පැවතීම
- ඉගැන්වීම් කලාවේ විද්‍යාත්මක පසුබිම පිළිබඳ ගැටලු

ඉහත දක්වා ඇත්තේ ගුරුවරයාගේ ආකල්පවල ස්වභාවය පර්යේෂණවලින් අනාවරණය වී ඇති ආකාරය පිළිබඳ සොයා ගැනීම් කිහිපයකි. මේ අතර ශ්‍රී ලංකාවේ කරන ලද පර්යේෂණ කිහිපයකින් ම

ගුරු ආකල්පවල ධනාත්මක ලක්ෂණ අඩු බව (බන්ඩාර, ඇම්බැක්කේ, අනුලාවති, ජයසේන) සොයා ගෙන තිබේ. ඒවායේ පොදු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- ගුරුවරුන් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධ දක්වන අඩු පෙළඹීම
- සිසුන් පිළිබඳ ගුරුවරයා තුළ පැහැදිලි ඉලක්ක නොතිබීම
- වෙනස් වීම් කළමනාකරණය (Change management) පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම
- ළමයින්ට ඉගෙන ගත නොහැක්කේ දෙමාපියන්ගේ බලපෑම මත යැයි සිතීම
- ගුරුවරුන්ගේ වෘත්තීය තෘප්තිය අඩු වීම
- ගුරුවරුන්ට අනවශ්‍ය වැඩ ප්‍රමාණයේ (Workload) වැඩි වීම නිසා රාජකාරියට අඩු අවධානයක් දැක්වීම
- වෘත්තීය හා බැඳී පවතින, ඉඳුම්, හිටුම්, ප්‍රවාහන පහසුකම්, ආහාරපාන, මෙන් ම පවුල් ආශ්‍රිත ගැටලු නිසා ඒවා ධනාත්මක ආකල්ප වර්ධනයට අහිතකර ලෙස බලපෑම

මෙලෙස ඉහත දැක්වූ දේශීය විදේශීය පර්යේෂණ අනාවරණ සියල්ලක් ම සලකා බැලූ විට සදාචාරාත්මක සංවර්ධනයට විවිධ හේතු සාධක මත පැන නැඟී ඇති ඍණ ආකල්ප බලපා ඇති බව පෙනී යයි.

ඉහත තත්ත්වය සලකා බලන විට ගුරුවරුන් තුළ ධනාත්මක ආකල්ප වර්ධනය ගුරුවරයාගේ සදාචාර ජීවිතයට බෙහෙවින් අවශ්‍ය වේ. කාල් රොජර්ස් (Rogers, 1960) පෙන්වා දෙන පරිදි ගුරුවරුන්ගේ මානසික චිත්තවේග හා පාරිසරික වශයෙන් ඇති වී තිබෙන තත්ත්වයන් ධනාත්මක ලෙස වෙනස් කිරීම තුළින් පාසල් පිළිබඳ ආකල්ප වෙනස් කළ හැකි ලෙසත් සදාචාරාත්මක ගුරු ජීවිත ගොඩ නැඟීම ඇති කළ හැකි බවත් පැහැදිලි ය. අනෙක් අතට ගුරුවරුන්ට පවුල, පාසල, පරිසරය ආශ්‍රිත ගැටලුවලට මුහුණ දීමේ මානසික ශක්තිය වර්ධනය කර ගැනීමෙන් සදාචාරාත්මක පෞරුෂය ගොඩ නඟා ගැනීමට හැකියාවක් තිබේ.

**ගුරුවරුන්ගේ සදාචාර සංවර්ධනයට අදාළ වන මූලික මග පෙන්වීම්**

- ගුරුවරුන්ට අදාළ සදාචාර සංවර්ධන සංකල්පය මැනවින් අවබෝධ කර ගැනීම
- ගුරු භූමිකාව යනු කුමක් දැයි පැහැදිලි ව වටහා ගැනීම
- සදාචාර සංවර්ධනය පිළිබඳ චිත්තවේගී නැඹුරුව (ආකල්ප) සංවර්ධනය කිරීම
- තම ගුරු වෘත්තියට ආදරය කිරීම (Love of Profession)
- පාසල් සිසුන්ට ආදරය කිරීම (Love of Children)
- ඉගැන්වීම් සඳහා හොඳින් සූදානම් වීම (Preparation for teaching)
- ප්‍රතිජනනාත්මක ඉගෙනුම් ඉගැන්වීම් වාතාවරණයක් ගොඩ නගා ගැනීම
- ගුරුවරයා ස්වකීය පිරිසිදු බව ක්‍රමවත් බව හා සෞඛ්‍යමත් බව ආරක්ෂා කර ගැනීම
- සිසුන්ට අනුකරණයට සුදුසු ප්‍රතිජනනාත්මක ආදර්ශමත් භූමිකා ආකෘතියක් වීමට (Positive role model) උත්සාහ ගැනීම
- ධනාත්මක ගුරු ආකල්ප, අපේක්ෂා පවත්වා ගැනීම
- ගුරුවරුන් පරිපාලකයන්, දෙගුරුන් හා ශිෂ්‍යයන් යන අයගෙන් සැදුම් ලත් ඉගෙනුම් සමාජයක සාමාජිකයකු බවට පත්වීම
- ගුරු අපචාරි ක්‍රියාවලින් වැළකීම සහ අන් අය ද වැළැක්වීම
- ඉගැන්වීම හා බැඳි සාරධර්ම පිළිපැදීම (පූර්ණ ළමයෙකු සංවර්ධනය කිරීම, අනාගත ජීවිතය උදෙසා බුද්ධිය, චිත්තවේගී හා සාමාජීය වශයෙන් වැදගත් වන ජීවන කුසලතා අත්පත් කර ගැනීමට සහාය වීම, ඉගෙනුමට ආදරයක් ජනිත කිරීම, පෙළඹවීම හා අභිමතාර්ථ පිහිටුවා ගැනීම පහසු

කරවීම (ආත්ම සම්මානනයට මග පෙන්වීම අනුන්ට උදව් කිරීමේ ගුණයෙන් දිරිගැන්වීම)

- ගුරු සිසු සබඳතා වර්ධනය කර ගැනීම
- ගුරුවරයා මානුෂික වීම, ප්‍රජාතන්ත්‍රවාදි ලෙස කටයුතු කිරීම, අපක්ෂපාති වීම, නීති ගරුක වීම, හා ආචාරශීලි ලෙස කථා කිරීම හා ක්‍රියා කිරීම පිළිබඳ සැලකිලිමත් වීම
- තම පාසල හෝ අන් අය විවේචනය කිරීම හා හෙළා දැකීමෙන් වැළකීම
- කාල කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කිරීම
- පාසලේ වගකීම්, යුතුකම් හා කාර්යභාරය නිරහංකාර ව, අවංක ව ඉටු කිරීම
- ගුරු නිපුණතා (Teachers competencies) (Morrison, 2005:182)
- සාධාරණත්වය, යුක්ති සහගත බව, අපක්ෂපාතීත්වය, සහයෝගය දීම කැප වීම වර්ධනය කර ගැනීම
- ශිෂ්ට භාෂාවක් (Polite language) භාවිත කිරීම
- ගුරු විනය සංවර්ධනය කර ගැනීම
- ආත්ම අභිමානය ආත්ම දමනය ඇති කර ගැනීම
- නිහතමානි බව හොඳින් පවත්වා ගැනීම
- සහනුකම්පාව යහපත කෙරෙහි යොමුවීම

ඉහත දක්වන ලද විග්‍රහය අනුව ගුරුවරයා සදාචාරාත්මක චර්යාව වර්ධනය කර ගත යුතු ය. ගුරු ජීවිතයේ කාර්යක්ෂමතාව සදාචාරය මත රැඳී පවතින බව මේ අනුව පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අධ්‍යාපන අංශය (2001). *අධ්‍යාපනයේ දාර්ශනික පදනම*. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

අබේපාල, රෝලන්ඩ් සහ අබේපාල, අරුන්දති (2016). *අධ්‍යාපන මාර්ගෝපදේශය හා උපදේශනය*. සාර ප්‍රකාශන.

ඇන්ඩර්සන්. එල්.ඩබ්. (1999). *ගුරු සඵලතා වර්ධනය.* යුනෙස්කෝ අධ්‍යාපනික සැලසුම් පිළිබඳ ජාත්‍යන්තර ආයතනය, ජාතික ගුරු අධ්‍යාපනික අධිකාරිය.

ඉකේදා, දයිසකු (2005). *සාරධර්ම අධ්‍යාපනය.* ලංකා බෞද්ධ සංගමය.

කොතලාවල, එල්.සී. (1979). *පියාජේගේ මනෝවිද්‍යා න්‍යාය.* ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්.

කොතලාවල, එල්.සී. (1996). *අධ්‍යාපන මනෝවිද්‍යාව වෙළුම 1.* MEHE/GTZ ව්‍යාපෘතිය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය.

ඛුද්දක නිකාය (1960). *ධම්මපදය.* බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

ගමගේ, එස්. අයි. (2005). *පාඨශාලීය සාරධර්ම.* ආරිය ප්‍රකාශකයෝ.

ජාතික අධ්‍යාපන ආයතනය, (1989). *අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම.* මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය.

ධම්මාලංකාර, ඉත්තෑපාන (2000). *සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ බෞද්ධ සාරධර්ම.* දෙහිවලඃ ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්.

පඤ්ඤානන්ද හිමි, ඩී. (1994). *ගුරු භූමිකාව.* කොළඹඃ එස්. ගොඩගේ.

පෙරේරා, ප්‍රියන්ත කමල්සිරි (2014). *ඇමරිකානු උපදේශන සංගමයේ ආචාර ධර්ම සංග්‍රහය.* කොළඹ විශ්වවිද්‍යාලය. අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශයේ වෘත්තීය උපදේශන සේවා සංගමයේ ප්‍රකාශනයකි.

ප්‍රේමසිරි, පී.ඩී. (1992). *බෞද්ධ ආචාර ධර්ම.* බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

මිලර්, බොනි (2005). *පංති කාමරයෙහි ළමයින් සමඟ සම්බන්ධ වීම. ගුරුවරුන් සඳහා අත්පොතක්.* (පරිවර්තනය මහාචාර්ය ලාල් පෙරේරා) ශ්‍රී ලංකා පදනම් ආයතනය සහ ජපන් ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රකාශනයකි.

වීරසිංහ, හෙන්රි (2002). *බුදු දහමින් පිළිබිඹු වන සාමය උදෙසා අධ්‍යාපනය.* රත්මලානඃ විශ්වලේඛා ප්‍රකාශකයෝ.

*සුත්තනිපාතය* (1977). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 23. ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

American Psychological Association (1992). *Ethical principles of Psychology and cord of conduct*, Washington.

Banadura, Albert and Walters, Richard (1976). *Social Learning and Personality Development*. N.Y. London: Holt Rinehart

Bandura, A. (1964). *Principle of Behaviour Modofication*. New York: Holt Rinehart

Cenker, W. (1995). *Tradition of Teachers*. New Delhi: Motilal Banarsidas.

Kohlberg. L, (1958). *Moral Development and identification*. N.S.S.E. year Book. University of Chicago.

Kotalawala, D.E.M. (1971). *An investigation of Department of the Moral Judgement in a group of 10-14 year old British and Ceylonese children.* Unpublished Doctoral Dissertation. University of London.

Narihasamy & Logeak Worn A.K. (2015). Teacher as Moral Model are we caring enough word. *Journal of Education*.

Pantic, & Wubbleis, T (2012). Teachers Moral values and their Interpersonal relationship with students and cultural competence. *International Jouranal of Education*.

Peters, R.S. (1969). *Ethics and Education*. London: New York.

Piaget. S. (1912). *The Moral judgment of the child*. Glence III. Free press.

Teo, C.T. (2013). *Trainee chers as Role Models in Moral Reasoning and Ethical Behavior*. Journal of the NUS Teaching Academy.

Yashoda, G. Kumar, K.P. (2017). *Role of the teacher inculcating Moral values among High School Pupils*. IMPACT International Journal of Research in Humanities.